// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1763/1 - 2012 ජුනි මස 18 වැනි සඳුදා - 2012.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයන්හී සවිස්තරව දක්වා ඇති ඉඩම් නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වහා අවශ්‍ය වී ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 ජුනි මස 11 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය I

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 01, මට්ටක්කුලිය කොට්ඨාසය තුළ පිහිටි, බලයලත් මිනින්දෝරු එම්. කලුතන්ත්‍රී විසින් මැන පිළියෙළ කරන ලද 2002.10.10 දිනැති අංක 675 දරන සැළස්මේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුලු ප්‍රමාණයෙන් අක් 5 රූඩ් 0 පර්. 26.00 (හෙක්ටෙයාර් 2.0892) ක් පමණ වන පහත සඳහන් නම් වලින්, ප්‍රමාණයන්ගෙන් හා මායිම් වලින් යුක්ත වූ ඉඩම් කොටස (01).

කැබලි අංක 01 - වරිපනම් අංක 50, ශ්‍රී පඤ්ඤානන්ද මාවත
ප්‍රමාණය - අක්. 05 රූඩ්. 0. පර්. 26.00 (හෙක්ටයාර් 2.0892)

| | | |
|---|---|---|
| උතුරට | : | පාර, ශ්‍රී පඤ්ඤානන්ද මාවතේ වරිපනම් අංක 70/105 සහ ෆර්ගියුෂන් පාරේ වරිපනම් අංක 427, 427/40, 435 හා 435/1 ; |
| නැගෙනහිරට | : | ශ්‍රී පඤ්ඤානන්ද මාවතේ වරිපනම් අංක 70/105, ෆර්ගියුෂන් පාරේ වරිපනම් අංක 421/1, ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියනු ලබන ඉඩම සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එම්. කළුතන්ත්‍රී විසින් මැන පිළියෙල කරන ලද සැලසුම් අංක 616හි කැබලි අංක 1 හා 3 ; |
| දකුණට | : | ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එම්. කළුතන්ත්‍රී විසින් මැන පිළියෙල කරන ලද සැලසුම් අංක 616 හි කැබලි අංක 1 හා 3 සහ මු.පි.කො. 4944 හි ඉතිරි කොටස ; |
| බටහිරට | : | මු.පි.කො. 4944 හි ඉතිරි කොටස සහ පාර. |

1A - G 016213 — 340 (2012/06)

සැ. යු.- *අති විශෙෂ ගැසට් අංක 1762/1 කාණ්ඩය 1762/45 න් අවසන් වේ.*

උපලේඛනය II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 01, මට්ටක්කුලිය කොට්ඨාසය තුළ පිහිටි, බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් මැන පිළියෙළ කරන ලද 2008.06.02 දිනැති අංක 9623 දරන සැළස්මේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුලු ප්‍රමාණයෙන් අක් 8 රූඩ් 1 පර්. 6.00 (හෙක්. 3.3540) ක් පමණ වන පහත සඳහන් නම් වලින්, ප්‍රමාණයන්ගෙන් හා මායිම් වලින් යුක්ත වූ ඉඩම් කොටස (01).

කැබලි අංක 01 - වරිපනම් අංක 19, හේනමුල්ල පටුමග

ප්‍රමාණය - අක්. 08 රූඩ්. 1. පර්. 6.00 (හෙක්ටයාර් 3.3540)

| | | |
|---|---|---|
| උතුරට | : | ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියනු ලබන මු.පි.කො. 4944 හි කැබලි අංක 01 හි ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | : | ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියනු ලබන මු.පි.කො. 4944 හි කැබලි අංක 01 හි ඉතිරි කොටස සහ හේනමුල්ල පටුමග ; |
| දකුණට | : | හේනමුල්ල පටුමග සහ නිවෙස්වලට යන පාර ; |
| බටහිරට | : | ලංකා ඔක්සිජන් සමාගම හිමිකම් කියනු ලබන ශ්‍රී පඤ්ඤානන්ද මාවතේ වරිපනම් අංක 50 දරන ඉඩම සහ කොළඹ මහ නගර සභාව හිමිකම් කියනු ලබන ශ්‍රී පඤ්ඤානන්ද මාවතේ වරිපනම් අංක 60 දරන ඉඩම් කොටස සහ ශ්‍රී පඤ්ඤානන්ද මාවත. |

07 - 26

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.